**<u>කැලණිය අධ්‍යාපන කලාපය</u>**

**<u>චිත්‍ර කලාව - අත්පොත - දෙවන වාරය</u>**

**<u>8 ශ්‍රේණිය</u>**

<u>පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි.</u>

තේමාවට උචිත මානව රූප, ඉරියව්, වර්ණ යොදා දී ඇති චිත්‍ර අධ්‍යයනය කර පහත සඳහන් මාතෘකා යටතේ චිත්‍ර ඇඳ වර්ණ කරන්න.

1.2.2.ආගමික පරිසරය ඇසුරෙන් බැතිබර අවස්ථාවක් චිත්‍රයට නගමු.



1.2.3. ජාතික නිදහස් උත්සවය

උදාහරණ




1.3.1. සොබා දහමේ අසිරිය

උදාහරණ



2.2.1. ශබ්දකෝෂයක්/ ලොකු පොතක්, වීදුරු බෝතලයක්, වොලි බෝලයක්/නෙට් බෝලයක්, ද්‍රව්‍යවල පරිමාණ , පර්යාවලෝකය, ඒළිය හා අඳුර ත්‍රිමාණ ලක්ෂණ යන සංරචන සිද්ධාන්ත භාවිත කරමින් චිත්‍රය ඇඳ වර්ණ ගන්වන්න.

උදාහරණ-



3.2.1. මුලුතල ශාක පත්‍ර මවන රටා (ස්වභාවික පරිසරයේ දැකිය හැකි ශාක පත්‍ර ඇසුරින් ව්‍යාප්ත සැරසිල්ලක් නිර්මාණය කර වර්ණ කරන්න)

උදාහරණ-



3.3.1. කුෂන් කවරයක් නිර්මාණය කරමු

- කුෂන් කවරයක් මුලුතල මෝස්තරයකට නිර්මාණශීලිව අඟල් 9x9 ප්‍රමාණයේ අමු රෙදි කැබැල්ලක් යොදා ගනිමින් රෙදි පින්තාරු තීන්ත ගෙන ඇඳ වර්ණ කරන්න.
- චිත්‍රය අඳින විට අමුරෙද්ද සෘජුෆෝම් එකක් උඩ ඇල්පෙනිති වලින් හොඳින් රඳවා ගන්න.
- වර්ණවල පැහැය අඩු වැඩි කිරීමට ජලය භාවිත නොකොට පින්තාරු වර්ණ පමණක් භාවිත කරන්න.
- වර්ණ ගන්වා අවසන්ව දින දෙකකින් පමණ වියළුණු පසු පිට පැත්ත හොඳින් මැද ගන්න.

උදාහරණ-



3.3.2. නිර්මාණාත්මක සැරසිලි ඒකකයක් හෝ කිහිපයක් හෝ භාවිත කර සාරි පල්ලුවක් නිර්මාණය කරන්න.

උදාහරණ-




4.1.2. පාසලේ පැවත්වෙන විවිධ ප්‍රසංගයක් සඳහා නිර්මාණාත්මක අක්ෂර යොදා දැන්වීමක් නිර්මාණය කරමු

උදාහරණ-



4.2.1. ළමා ගීතයකට හෝ ළමා කතාන්දරයකට සුදුසු සන්නිදර්ශන චිත්‍රයක් අඳිමු.

උදාහරණ-




5.1.2. ඇඹීමේ ශිල්ප ක්‍රමය ඇසුරින් සරල මානව රූපයක් නිර්මාණය කරමු.

උදාහරණ- මැටි මාධ්‍යයෙන් ඉදිරි හෝ පැති පෙනුම දර්ශනය වන ආකරයට කුඩා හැඩ අඹුවෙන් මැටි කොටස් නොගැළවෙන සේ උපකරණයක ආධාරයෙන් හොඳින් තද කරමින් අදාළ හැඩ මතු කරන්න.



5.2.1.සම්ප්‍රදයික සත්ත්ව රූප ඇසුරින් අල්ප උන්නත කැටයමක් නිමවමු.(සෑජුෆෝම් තලය මත දළ සටහන ඇඳ අවශ්‍ය තැන් මතුවන පරිදි අනවශ්‍ය කොටස් කපා ඉවත්කර අල්ප උන්නත කැටයම නිර්මාණය කර ගැනීම).

උදාහරණ-



**6.2.1.පාරම්පරික මැටි කලා කර්මාන්තය අගයමු.**

- මැටි කලා කර්මාන්තය සෑම පුරාතන ශිෂ්ටාචාරයකම තිබූ බවට පුරාවිද්‍යාත්මක සාධක පවතී. ශ්‍රී ලංකාවේද මෙගලිතික සුසාන භූමි ආශ්‍රිත කාලනිර්ණය කරන ලද මැටි භාණ්ඩ රාශියක් හමුවී තිබේ.

- යාපනය කන්තරෝඩය, අනුරාධපුර, පොලොන්නරුව සහ මහනුවර පූජා ස්ථානවල කැණීම් අනුව සාම්ප්‍රදායික මැටි භාණ්ඩ රාශියක් හමු වී ඇත.

- කෙයොලින් මැටි, රතු මැටි සහ කහ මැටි ද භාවිත කොට තිබේ.

- මැටි භාණ්ඩ සකස් කර ගැනීමට පෙර ගල්, වැලි හා රොඩු ආදිය ඉවත් කරමින් මැටි පදම් කරගනු ලැබේ. සාම්ප්‍රදායිකව මැටි පයින් පාගා පදම් කරගනු ලබන අතර වර්තමානයේ යන්ත්‍රානුසාරයෙන් මැටි අඹරා සකස් කරනු ලැබේ.

<u>නිර්මාණය කරනු ලබන භාණ්ඩ වර්ග</u>

- ගෘහාසක්ත භාණ්ඩය - වළන්, මුට්ටි, කළගෙඩි ආදි මැටි භාණ්ඩ
- ආගමික කටයුතු හා උත්සව භාණ්ඩ - කොතලය,බුම්මැඩිය, පහන්, පූනාව, කොත් කැරලි ආදිය
- ඉදිකිරීම් ද්‍රව්‍ය - උළු,කොත්,පිහිලි,නළ
- කර්මාන්ත ආශ්‍රිත භාණ්ඩ - ගිනි කබල, උදුන, කෝව

<u>මැටි භාණ්ඩ නිර්මාණය කිරීමේ ශිල්ප ක්‍රම</u>

අත් සකපෝරුව හා පා සකපෝරුව

- මැටි භාණ්ඩ පිළිස්සීම සඳහා මුල් කාලයේ මැටි භාණ්ඩ මත පිදුරු දමා ඒ මත මැටි තට්ටුවක් අතුරා පුළුස්සා ගත් අතර පසුව ගඩොල් හා මැටි භාවිතයෙන් සකස් කොට ගත් සරල පෝරණුවක් භාවිත විය.

- මැටි භාණ්ඩ අලංකරණය - තෙත මැටි බඳුනේ මොස්තර ඇඳීම, අච්චු අලංකරණය, පිළිස්සූ බඳුනේ මොස්තර ඇඳීම දිස්නය ලබා ගැනීමට අලේපන යොදා ගැනීම.(සුලිය, සුලි දෙක, දිය රැලි, හවඩිය, පලා පෙති, ලියවැල්, හේරුණ්ඩ පක්ෂියා, බෝ පත්, කතිර මල, හංසයා මොස්තර සඳහා යොදා ගැනේ).

- කැළණිය, මාතලේ, කෑගල්ල, රත්නපුරය, කලුතර, මුලතිව්, යාපනය, මන්නාරම වැනි ප්‍රදේශ මැටි භාණ්ඩ සඳහා ප්‍රචලිතය.



*අත්සකපෝරුව*



*පා සකපෝරුව*

**ඇගයීම**

| | | |
|---|---|---|
| මැටි කලා කර්මාන්තයේ ඓතිහාසික පසුබිම | | |
| මැටි කලා කර්මාන්තය පවතින ප්‍රදේශ | | |
| මැටි භාණ්ඩ නිෂ්පාදනය කරන ක්‍රමවේද | | |
| මැටි භාණ්ඩ සඳහා මාධ්‍ය සකස් කර ගැනීම | | |
| මැටි භාවිතයෙන් නිෂ්පාදනය කරන භාණ්ඩ | ගෘහ භාණ්ඩ | |
| | ආගමික හා උත්සව භාණ්ඩ | |
| | ඉදිකිරීමේ භාණ්ඩ | |
| මැටි භාණ්ඩ අලංකරණය සඳහා භාවිත තාක්ෂණය හා සැරසිලි රටා | | |

**7.2.1.හින්දු පිළිමවල ආසන, ආසන ක්‍රම හා මුද්‍රා අධ්‍යයනය කරයි.**

<u>ආසන වර්ග</u>

- ප්‍රතිමාව වැඩ සිටින පීඨය ආසනය ලෙස හැඳින්වෙයි.
  - පද්මාසන ( නෙලුම් මල් පෙතිවලින් අලංකරණය ලද ඕවලාකාර හැඩයකි)
  - භද්‍රාසනය ( මෙය චතුරස්‍රාකාර හැඩයක් ගනී)



*පද්මාසන*




*භද්‍රාසනය*

<u>ආසන ක්‍රම</u>

- දෙපා පිහිටුවා ඇති ආකාරය අනුව
  - ලලිත ආසන ( පීඨය මත හිඳ සිටින ඉරියව්වකි. එක් පාදයක් නවා අනිත් පාදය නිදහසේ පහතට දමා සිටී. මෙම ඉරියව්වෙන් සරස්වතී දේවිය හා පාර්වතී නිරූපණය කොට ඇත).
  - රාජ ලීලාසනය ( වම්පය තිරස් අතට නමා දකුණු පයද සිරස්ව නවා ඒ මත දකුණු අතේ වැලමිට තබා සිටින ආකාරය)
  - පර්යංක ආසන ( පුටුවක හිඳ සිටින ඉරියව්වද, දෙපා නවා පහත තබා සිටින ආකාරයද වේ).






*ලලිත ආසන*






*රාජලීලාසනය*





පර්යංක ආසන


<u>මුද්‍රා</u>

- ප්‍රතිමාවේ දෑත් නිරූපණය කර ඇති ආකාරය මුද්‍රාව වේ. අභය මුද්‍රාව, ගජ හස්ත මුද්‍රාව, නමස්කාර මුද්‍රාව( අංජලී මුද්‍රාව), වරද මුද්‍රාව, විතර්ක මුද්‍රාව, කටක හස්ත මුද්‍රාව, ලෝල හස්ත මුද්‍රාව වේ.





*<u>අභය මුද්‍රාව -</u> නිදහස හා ආරක්ෂාව ලබා දීම සංකේතවත් කරයි.*




**<u>ගජ හස්ත මුද්‍රාව -</u>** *බාධක ඉවත්වී නිදහස ලැබීම*









**<u>නමස්කාර මුද්‍රාව / අංජලී මුද්‍රාව</u>** - *ආයාචනය, ප්‍රාර්ථනය හා වැඳීම යන අදහස් නිරූපනය වේ.*






<u>වරද මුද්‍රාව -</u> *වරයක් දීම මින් සංකේතවත් කරයි.*







<u>**විතර්ක මුද්‍රාව -**</u> *ගැටළුවක් විසඳන අවස්ථාවක් මුද්‍රාවෙන් නිරූපිතය.*

<u>කටක හස්ත මුද්‍රාව</u>:-
*බොහෝ විට ත්‍රිභංග ලක්ෂණ සහිත රූප වල හා ස්තෝත්‍රකරුවන්ගේ රූපවල දැකිය හැකිය.*






<u>ලෝල හස්ත මුද්‍රාව -</u> *තැන්පත් බව සංකේතවත් වන අතර කාන්තා දේව රූප වල බහුල වශයෙන් යෙදේ.*

7.3.1.යුරෝපා ප්‍රාග් ඓතිහාසික ගුහා චිත්‍ර අගයමු.

- යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික චිත්‍ර ක්‍රි.පූ 40000 -10000 ත් අතර කාලයට අයත් යැයි සැලකේ.
- ගුහා තුළ ජීවත් වූ ආදී මානවයන් එදිනෙදා ජීවිතයේ ලැබූ අත්දැකීම් ගුහාබිත්ති මත සිතුවම් කොට තිබේ. ( සත්ත්ව රූප, මානව රූප, ජ්‍යාමිතික හැඩතල හා විවධ සංකේත)
- ප්‍රංශයේ ලැස්කෝ, ස්පාඤ්ඤයේ ඇල්ටමයිරා ගුහාව, ෆොන්ඩිගෝන් ගුහාව, කොගුල් ගුහාව ප්‍රධාන වේ.
- රේඛා චිත්‍ර, වර්ණ සිතුවම් ගල් බිත්තිය හාරා නිර්මාණය කරන රූප අත් සළකුණු - චිත්‍ර වර්ණ ගැන්වීම සඳහා අඟුරු, කිරිමැටි සහ සත්තව ලේ, හිරි ගල් , පස්, ජලය මැලියම් සමඟ මිශ්‍ර කර ඇත, කළු , අඳුරු රතු, දුඹුරු, අළු, සුදු යන වර්ණ බහුලව භාවිත කර තිබේ.
- මෙහි ඇති චිත්‍ර අතර බයිසන් රූප, අශ්ව රූප, පිණිමුවන් සහ වල් ඌරන්ගේ රූප දක්නට ලැබේ.




*ඇල්ටමයිරා ගුහා චිත්‍ර*

<u>ලැස්කෝ ගුහා චිත්‍ර</u>

- ප්‍රංශයේ පිහිටා ඇති අතර ක්‍රි. පූ 15000 ත් 13000ත් අතර කාලයට අයත් යැයි සැලකේ.

- රේඛා චිත්‍ර, වර්ණ සිතුවම්, ගල් බිත්තිය හාරා නිර්මාණය කරන රූප, ඇත සළකුණු, සත්තව රූප, විවිධ සංකේත, ජ්‍යාමිතික හැඩතල , බයිසන් රූපය විශාල වශයෙන් ඇඳ තිබේ.




- අඩි17 ක් දිග බයිසන් ගව රූපය විශිෂ්ට නිර්මාණයක් ලෙස සැළකේ, ඊතල පහර කා ඉදිරියට පනිමින් සිටින බයිසන්ගේ රුව සහ බිම වැතිරී සිටින මිනිසකුගේ රුව සහිත චිත්‍රය වැදගත්ය.

**ඇගයීම -** යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික චිත්‍ර ඇති ස්ථාන පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න